**ශීර්ෂ 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂ 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 14 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්ව ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,692.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,358.21 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 334.79 ක් හෙවත් සියයට 19.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 738.00 | 722.42 | 15.58 | 2.11 |
| මූලධන | 954.00 | 635.79 | 318.21 | 33.36 |
| **එකතුව** | **1,692.00** | **1,358.21** | **334.79** | **19.79** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් එකතුව රු. මිලියන 3,361 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 3,358 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 3 ක් හෙවත් සියයට 0.08 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25501 යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 47.00 | 46.85 | 34.00 | 42.68 | 210.00 | 154.59 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තැන්පත් ගිණුම් 08 කට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 580.40 කි. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000-0000-00-0002-0075-000 | 0.34 |
| 6000-0000-00-0001-0057-000 | 1.74 |
| 6000-0000-00-0017-0006-000 | 239.75 |
| 6000-0000-00-0013-0046-000 | 70.44 |
| 6000-0000-00-0016-0026-000 | 252.46 |
| 6000-0000-00-0018-0061-000 | 6.08 |
| 6000-0000-00-0019-0011-000 | 4.11 |
| 6000-0000-00-0001-0000-000 | 5.48 |
| | ----------- |
| **එකතුව** | **580.40** |
| | ====== |

## 2.4 විගණන නිරීක්ෂණය

----------------------

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 වන ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | | |
|---|---|---|
| (ඇ) | විදුලි උපකරණ පිලිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (ඇ) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඊ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**

**----------------**

**අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 59 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනවල ඇතුළත් වැය විෂයයන් 11 ක් හා 19 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 අනුව රු.55,138,500 ක් එකතු කිරීම් හා අඩු කිරීම් සිදුකිරීමද එක් වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.17,000,000 ක් ලබාගැනීමද හේතුවෙන් අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදනයන් පිළිබඳව පුරෝකථනය කර ඇස්තමේන්තු සැකසීම නිරවද්‍යතාවයකින් යුතුව සිදුකර නොමැති බවට නිරීක්ෂණය විය.

**3.3 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

අංක 6003/0000/00/0001/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයක් නොමැති අතර, භාණ්ඩාගාර පොත් අනුව රු.10,000,000 ක හර ශේෂයක් විය. භාණ්ඩාගාරය වෙත පියවිය යුතු මෙම හර ශේෂය නිරවුල් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මේ දක්වා කටයුතු කර නොතිබුණි. 2017 ජනවාරි 26 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් යන දෙදෙනා විසින් මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර විමර්ශනයක් සිදු කරන ලෙසට උපදෙස් ලබාදී ඇති නමුත් එම කමිටුව පත් කිරීමටද මෙතෙක් ක්‍රියා කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25501 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

2016 දෙසැම්බර් 31 දින වනවිට පැවති හිඟ ණය ශේෂ එකතුව රු.4,633,206 ක් වූ අතර, එයින් 2017 ජූනි 30 දින වනවිට රු.277,353 ක් අයකර තිබූ බැවින් එදිනට හිඟ ණය ශේෂ එකතුව රු.4,355,853 ක් විය. එම ශේෂය මාස 01 සිට වර්ෂ 20 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි.

(i). 2016 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති මුළු ණය ශේෂය වන රු.4,633,206 න් රු.2,842,745 ක් 1997 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැඩතහනමට ලක්වූ නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ විය. තවද මුළු හිඟ හිටි ණය ශේෂයෙන් රු.3,026,802 ක ණය ශේෂයක් අවුරුදු 05 ඉක්මවූ ණය ශේෂ වූ අතර, එය මුළු හිඟ හිටි ණය ශේෂයෙන් සියයට 65 ක් විය.

(ii). සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂවලදී නිලධාරීන්ගෙන් රු.154,585 ක ණය ශේෂයන් වැඩිපුර අයකර ගෙන ඇති අතර, එම මුදල් වැඩිපුර අයකර ඇති නිලධාරීන්ට ආපසු ගෙවීමට හා ණය අයකිරීම් සම්බන්ධයෙන් සටහන් නිවැරදි කිරීමට මේ දක්වා ක්‍රියා කර නොතිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

2013 ජනවාරි 23 දිනැති අංක SA/AS/AA/Circular දරන සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතු රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කළ උපචිත පදනම මත වූ ගිණුම් 2016 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එහි පැරණි කාර්යාලය පිහිටුවා තිබූ ඉඩම හා ගොඩනැගිල්ල වර්ෂ 05 ක පමණ සිට අවිධිමත් ලෙස මහරගම ගොවිජන සේවා කාරක සභාව වෙත මුදාහැර තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් ඉඩමක් විධිමත් පරිදි පවරා නොගෙන මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එහි නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(ඇ) වාහන නඩත්තුව

-----------------

වාහනවල ඉන්ධන භාවිතය අකටයුතුකම්වලින් තොරව විනිවිද භාවයකින් යුක්තව සිදුකිරීම සඳහා සෑම මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු බවට 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 මගින් උපදෙස්දී තිබුණද, නියැදි පරීක්ෂාවකට ලක්වූ කඩුවෙල, හංවැල්ල, මොරටුව හා කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන පිළිබඳව එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

**3.7 බේරුම් නොකළ බැරකම්**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවත එමින් තිබුණු මුළු බැරකම්වල එකතුව රු.745,578 ක් විය. වැය විෂයයන් 06 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය රු.112,773 ක් වී තිබුණෙන් එම ඉතිරිය රු.599,040 කින් ඉක්මවා රු. 711,813 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.8 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------------------

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී කොළඹ, තිඹිරිගස්යාය, කෝට්ටේ, රත්මලාන හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු. 4,172,460 ක් වූ ව්‍යාපෘතීන් 13 ක් සැලසුම් කිරීමේ දුර්වලතා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දුර්වල අධීක්ෂණය, කාලය ප්‍රමාණවත් නොවන බව කොන්ත්‍රාත්කරු දැන්වීම හා ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම යන කරුණු මත ආරම්භ නොකර අත්හැර දමා තිබුණි. මෙම ව්‍යාපෘති 13 සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.3,922,580 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.

**3.9 කාර්යසාධනය**

----------------

(අ) 2016 වර්ෂයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විමධ්‍යගත අයවැය වැඩසටහන අනුව මූලධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i). **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බල සීමාව තුල ග්‍රාම නිලධාරී වසම් 57 ක් පවතින අතර එම වසම්වල මූලධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස

රු.38,675,000 ක් විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඍජුවම ප්‍රතිපාදන වෙන්වී ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ ග්‍රාම නිලධාරී වසම් 09 ක් පවතින අතර ව්‍යාපෘති 01 සිට 07 දක්වා ක්‍රියාත්මක වූ ග්‍රාම නිලධාරි වසම් 44 ක් ද පිළිවෙලින් ව්‍යාපෘති 09, 14, 18, 19 ක් ක්‍රියාත්මක වූ ග්‍රාමනිලධාරී වසම් 04 ක් ද වේ. කෙසේවුවද, විමධ්‍යගත ප්‍රතිපාදන මගින් සංවර්ධන කටයුතු සිදුකිරීමේ විෂමතාවක් නිරීක්ෂණය වූ අතර එම ප්‍රතිලාභයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාසය කරන ජනතාව වෙත සාධාරණ අයුරින් බෙදී ගොස් නොමැති බවටද නිරීක්ෂණය විය.

**(ආ) ආදී නාලන්දීය ගුරු ගම්මානයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම (රු.800,000)**

---------------------------------------------------------------------------------

ආදි නාලන්දීය ගුරු ගම්මානයේ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඵලදායී නොවන ව්‍යාපෘතියක් බව කඩුවෙල ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර දන්වා තිබුණි. එසේ වුවද, කොළඹ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය මත එම ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.800,000 ක ප්‍රතිපාදනයෙන් රු.776,682 ක් වැය කර සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබුණද, එය මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.10 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

**-------------------------------------------------------------------**

ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂණවලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සියළුම ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ව්‍යාපෘති සඳහා මිල කැඳවීම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවල, අඩු මිල ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන්ගේ මිල කැඳවීම් ප්‍රතික්ෂේප කර ඊට වැඩි මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් තෝරා ගැනීමට හේතු වෙන් වෙන් වශයෙන් විස්තර කර නොතිබුණු අතර, සෑම ව්‍යාපෘතියක් වෙනුවෙන්ම තාක්ෂණික ඇගයීම් වාර්තාද විධිමත් පරිදි වෙන් වෙන් වශයෙන් පිළියෙල කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

**3.11 පාඩු හා හානි**

**-------------**

සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ අවුරුදු 05 ට අඩු රු.93,227,459 ක් හා අවුරුදු 5 – 10 ත් අතර රු.146,016 ක් වූ සිද්ධීන් 10 කට අදාළ හානි හා පාඩු දක්වා ඇතත්, 2017 ජූනි 05 දින වනවිටත් රු.93,346,613 ක හානි පාඩු මුදල් රෙගුලාසි ප්‍රකාරව අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

(අ) 2012 සිට 2016 දක්වා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල සීමාවට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i). ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් මගින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විශ්‍රාම වැටුප් ගෙවීමේදි 2017 ජූනි 30 දිනට එකතුව රු.13,117,482 ක් වැඩිපුර ගෙවා තිබුණි. විස්තර පහත පරිදිවේ.

| විස්තරය | වැටුප් ගෙවීම (රු) |
|---|---|
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා | 5,170,737 |
| සිවිල් විශ්‍රාම වැටුප් | 7,683,090 |
| හමුදා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් | 263,655 |
| **එකතුව** | **13,117,482** |

(ii). වැඩිපුර ගෙවා ඇති නමුත් 2017 ජූනි 30 දින වනවිටත් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැති වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, සිවිල් විශ්‍රාම වැටුප් හා හමුදා නිලධාරීන් සඳහා වූ විශ්‍රාම වැටුප්වල මුළු වටිනාකම රු.13,117,482 ක් විය. එහි කාල විශ්ලේෂණය පහත පරිදි දැක්වේ.

| | වටිනාකම (රු) |
|---|---|
| වර්ෂ 01 ට අඩු | 7,622,799 |
| වර්ෂ 01 – 05 ත් අතර | 4,191,080 |
| වර්ෂ 05 ට වැඩි | 990,389 |
| අයකළ නොහැකි පාඩු | 313,214 |
| මුළු වටිනාකම | 13,117,482 |

(ආ) 2012 වර්සයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාළව විශ්‍රාම වැටුප් අංශ මගින් විශ්‍රාමිකයින් මියගිය පසුව ගෙවා ඇති විශ්‍රාම වැටුප් වටිනාකම රු.6,092,261 ක් 2017 ජූනි 30 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පුහුණු වැඩසටහනකින් පසු පුහුණුලාභීන් එම පුහුණුවෙන් ලබාගත් දැනුම ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳ පසුවිපරම් කිරීමට ක්‍රමවේදයක් සකස් කළයුතු වුවත්, රු.1,200,000 ක වියදමක් දරා පවත්වන ලද කාන්තාවන් සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහනෙහි ප්‍රගතිය ඇගයීමට විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් විගණන දිනය වනවිටත් ක්‍රියාවට නංවා නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 45 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 33 | 21 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 1,224 | 1,044 | 180 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 137 | 114 | 23 |
| | **එකතුව** | **1,444** | **1,224** | **220** |